# ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ්හි වෙනත් නිර්දේශ...

**ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ්**
ඉමිඩක්ලෝප්‍රිඩ් 200 ග්‍රෑ/ලී එස් එල්

| බෝගය | මර්දනය වන පළිබෝධකයින් |
|---|---|
| වී | දුඹුරු පැළ කීඩෑවන්, පැළ මැක්කන් |
| මිරිස්, මාළු මිරිස් | කොළ කොඩවීම පතුරුවන කුඩිත්තන්, පැල මැක්කන් සහ සුදු මැස්සන් |
| අර්තාපල් | ග්‍රීන් පීච් කුඩිත්තන් |
| බටු | කොරපොතු කෘමීන් හා පිටි මකුණන් |
| මාෂ බෝග | කුඩිත්තන්, කොරපොතු කෘමීන් හා පිටි මකුණන් |
| විසිතුරු බෝග හා කැපූ මල් | කුඩිත්තන්, සුදු මැස්සන් සහ කොරපොතු කෘමීන් |
| පොල් | තවාන් හා පැළවලට හානිකරන වේයන් |
| අඹ | පත්‍ර කීඩෑවන් |
| පැපොල් | පිටි මකුණන් |
| බෝංචි, මෑ, ගෝවා, තක්කාලි, බණ්ඩක්කා සහ කරවිල, පතෝල, පිපිඤ්ඤා, වට්ටක්කා ආදී කුකබිටේසි කුලයේ බෝග ඇතුළු සියලුම වගාවන් | පැළ මැක්කන්, කොරපොතු කෘමීන්, සුදුමැස්සන්, කුඩිත්තන් |

මී මැස්සන් වඩාත් ක්‍රියාකාරී අවස්ථාවල (උදෑසන සහ සවස) ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ් යෙදීමෙන් වළකින්න. පළිබෝධනාශක යෙදීමේදී හානිය නිවැරදිව හඳුනාගෙන නිර්දේශිත පළිබෝධනාශක භාවිතා කරන්න. **සැමවිටම ලේබලයේ උපදෙස් කියවා නිසි ලෙස පිළිපදින්න.**

Hayleys AGRICULTURE

හේලීස් ඇග්‍රිකල්ච හෝල්ඩින්ස් ලිමිටඩ්
25, ෆොස්ටර් පටුමග, කොළඹ 10,
දුරකථන: 0112 688960-3 / ෆැක්ස්: 0112 697202

**පළිබෝධනාශක අනතුරු සහිතයි. ප්‍රවේශමෙන් පරිහරණය කරන්න.**

# ළූණු වගාවේ පැළ මැක්කාගේ හානිය මර්දනයට

BAYER

**ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ්**
ඉමිඩක්ලෝප්‍රිඩ් 200 ග්‍රෑ/ලී එස් එල්

# ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ්

ඉමිඩක්ලෝප්‍රිඩ් 200 ග්‍රෑ/ලී එස් එල්

එක්වරක් යෙදුවත් පැළ මැක්කාගෙන් ආරක්ෂාව




පැළ මැක්කාගේ හානිය

පැළ මැක්කා

Admire® is the registered trademark of Bayer AG, Germany

Hayleys AGRICULTURE

CNI Chloronicotinyl Insecticides — Innovative Pest-Management, Invented by Bayer.

BAYER Bayer CropScience

**ඒකාබද්ධ පළිබෝධ මර්දන ක්‍රම භාවිතයෙන් පළිබෝධනාශක යෙදීම අවම කරගන්න.**

## ළූණු පැළ මැක්කා

ශ්‍රී ලංකාවේ ළූණු වගාවේ දක්නට ලැබෙන ප්‍රධාන කෘමි පළිබෝධකයා වේ. සුහුඹුලා ලා දුඹුරු පැහැති කුඩා කෘමියෙකි. උණුසුම් කාළගුණයක් ඇති ජූලි, අගෝස්තු මාසවල බහුලව දක්නට ලැබේ.



පැළ මැක්කා (ශිශුවා)



පැළ මැක්කා (සුහුඹුලා)



ළූණු පත්‍රමත සිටින පැළ මැක්කන්

## පැළ මැක්කාගේ හානිය

පැළ මැක්කා ළූණු කොළය සූරා යුෂ උරා බොයි. පත්‍රය මත ඇතිවන සුදු පැහැති සීරුම් ලකුණු මගින් මෙම හානිය හඳුනාගත හැකිය. හානිය අධික අවස්ථාවල පත්‍ර ඇඹරී මලානික වී අවසානයේ මැරී යයි.

පැළ මැක්කන් බහුලව දක්නට ලැබෙන්නේ පත්‍ර පාදස්ථ ප්‍රදේශයේය.



පැළ මැක්කාගේ හානිය



පැළ මැක්කාගේ හානියට ලක්වූ ළූණු වගාවක්

පැළ මැක්කාගේ හානිය නිසා ළූණු වගාවේ අස්වැන්න ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව බෙහෙවින් අඩු වී යයි.

ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ්
ඉමිඩක්ලෝප්‍රිඩ් 200 ග්‍රෑ/ලී එස් එල්

## පැළ මැක්කා මර්දනය

ළූණු වගාවේ පැළ මැක්කා මර්දනය සඳහා ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ් නිර්දේශ කර ඇත.

| මිශ්‍රණය (ජලය ලී. 10 කට) | මිශ්‍රණය (ජලය ලී. 16 කට) | යෙදිය යුතු ප්‍රමාණය |
|---|---|---|
| මි. ලී. 10 | මි. ලී. 16 | හෙක්ටයාරයකට මි. ලී. 160-200 (අක්කරයකට මි. ලී. 64-80) |

පෙර අස්වනු කාලය දින 14 යි.

පැළ මැක්කාගේ හානිය අවම කරගැනීම සඳහා නියමිත කාලයට වගාව ආරම්භ කිරීම, වගාබිම පිරිසිදුව තබාගැනීම සහ පැළ මැක්කා රැඳී සිටිය හැකි වෙනත් ධාරක ශාක ඉවත් කිරීම ආදී ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම සඳහාද යොමුවන්න.

## ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ්හි සුවිශේෂ ක්‍රියාකාරීත්වය

- ජර්මනියේ බේයර් ක්‍රොප්සයන්ස් ආයතනයේ නිශ්පාදනයක් වන ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ් ස්පර්ශයීය හා ආමාශගත විෂවීමේ ක්‍රියාකාරීත්වයකින්ද කෘමිනාශකයකි.
- සංස්ථානික කෘමිනාශකයක් වන ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ් ළූණු ශාකය මගින් සාර්ථකව උරාගෙන ශාකය තුල හොඳින් සංසරණය වේ. මේ නිසා යුෂ උරාබොන පැළ මැක්කන් සාර්ථකව මර්දනය කර ශාකයේ සෑම කොටසක්ම එක සමානව ආරක්ෂා කර දෙයි.
- ඇඩ්මයර් ඉමිඩක්ලෝප්‍රිඩ් ළූණු වගාවට කීපවරක් යෙදීමට අවශ්‍ය නොවන අතර ශාකයේ වැඩි කාලයක් රැඳී පැවතිමින් පැළ මැක්කාගේ හානිය අවම කිරීම සිදුකරයි.